(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 7(9).]

# පාර්ලිමේන්තුවේ අංක 7 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2013 පෙබරවාරි මස 22 වැනි සිකුරාදා**

## 2013 මාර්තු මස 05 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජනවාරි 15 දිනැති අංක 1793/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.02.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## 2013 අප්‍රේල් මස 09 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1894/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරන මාකඳුර නගර සංවර්ධන සැලසුම යටතේ හරිත නගරයක් හා හරිත ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කළත්, මේ වනවිට එහි ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙහි ඉදිකිරීම් නවතා දැමීමට හේතු කවරේද;

(ii) එම ඉදිකිරීම් සඳහා අරමුදල් සපයන ලද ආයතනය හෝ ආයතන කවරේද;

(iii) ඒ සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) හරිත නගරයේ හා හරිත ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් නැවත ආරම්භ කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1935/'11

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 වර්ෂයේ මැයි සිට ජූලි දක්වා වන කාල සීමාව තුළදී ශ්‍රී ලංකාවට බාල තත්ත්වයේ පෙට්‍රල් සහ වෙනත් ඛනිජ තෙල් නිෂ්පාදන සැපයූ සැපයුම්කරු හෝ සැපයුම්කරුවන්ගේ නම් කවරේද;

(ii) අමාත්‍යාංශය බාල තත්ත්වයේ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීමේදී සිදුවී ඇති වංචාවලින් බැහැර වන්නේ කෙසේද;

(iii) තත්ත්වයෙන් බාල පෙට්‍රල් භාවිතා කිරීම නිසා අලාභහානි විඳීමට සිදු වූ පාරිභෝගිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) තත්ත්වයෙන් බාල පෙට්‍රල් භාවිතා කිරීමෙන් ඇති වූ අලාභ හානි සම්බන්ධව පැමිණිලි කළ පාරිභෝගිකයන්ගේ නම් කවරේද;

(v) අලාභ හානි විඳීමට සිදු වූ එක් එක් පාරිභෝගිකයාට වන්දි වශයෙන් ලබා දුන් මුදල් ප්‍රමාණය කවරේද;

(vi) තත්ත්වයෙන් බාල පෙට්‍රල් හේතුවෙන් හානි වූ යන්ත්‍රෝපකරණ සහිත ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව කොපමණද;

(vii) එම ඉන්ධන පිරවුම්හල්වලට වන්දි ලබාදෙන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) තත්ත්වයෙන් බාල පෙට්‍රල් පිළිබඳ වංචාව ජනතාවට හෙළිකළ පාර්ශ්වයන් වෙත ආකර්ෂණීය ප්‍රසාද දීමනාවක් ලබා දෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2139/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ මහතා අතුරුදන් වී ඇති දිනය කවරේද;

(ii) ඔහු මේ වන විට ජීවතුන් අතර සිටින්නේද;

(iii) වධහිංසාවලට එරෙහි ජාත්‍යන්තර කමිටුව හමුවේ ශ්‍රී ලංකා රජය වෙනුවන් පෙනී සිටි මොහාන් පීරිස් මහතා ප්‍රගීත් එක්නැලිගොඩ මහතා ජීවතුන් අතර සිටින බවට ප්‍රකාශ කර තිබේද;

(iv) එසේ ප්‍රකාශ කර තිබේ නම්, ඔහු සිටින රට හෝ ප්‍රදේශය පිළිබඳව සඳහන් කරන්නේද;

(v) ඔහු විදේශගතව සිටී නම්, මෙරටට ගෙන්වා ගැනීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) උක්ත කමිටුව හමුවේ දී මොහාන් පීරිස් මහතා කළ ප්‍රකාශය සාවද්‍ය නම්, රටේ උත්තරීතර ආයතනයක උත්තරීතර නිලයක් දැරූ අයෙකු එසේ සාවද්‍ය තොරතුරු ජාත්‍යන්තරයට නිකුත් කර රටට සිදු කළ බලවත් අපකීර්තිය සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2210/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවන වැඩසටහන අනුව, අඩු ආදායම් නාගරික ජනාවාස ව්‍යාපෘතිය යටතේ නිවාස තැනීමට දෙන ලද පර්චස් දෙකක ඉඩම් කැබැල්ලේ පූර්ණ අයිතිය එහි වත්මන් පදිංචිකරුවන්ට ලබා දෙන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නේද?

(ආ) ඉහත වැඩසටහන යටතේ මේ වන විට පර්චස් දෙකක පූර්ණ අයිතිය හිමිවූ පවුල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2531/'12

ගරු අනුර දිසානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ වෛද්‍ය පීඨවල සායනික පුහුණුව සඳහා වන මහාචාර්ය ඒකක (Professor Units) ඇති රෝහල් කවරේද;

(ii) එම එක් එක් මහාචාර්ය ඒකකය 2012 මාර්තු 31 දින වනවිට අනුයුක්තව සිටින මහාචාර්යවරුන්, විශේෂඥ වෛද්‍යවරුන්, පශ්චාත් උපාධිය හදාරන වෛද්‍යවරුන් (Senior Registrar සහ Registrar), ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් මහාචාර්ය ඒකකයේ කටයුතු සඳහා පවතින ශල්‍යාගාර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජරට වෛද්‍ය පීඨයේ සායනික පුහුණුව සඳහා වන අනුරාධපුර මහ රෝහලේ මහාචාර්ය ඒකකය විවෘත කළ දිනය කවරේද;

(ii) දැනට එම මහාචාර්ය ඒකකයේ පුහුණුව ලබන වෛද්‍ය සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එහි පුහුණුව ලබන වෛද්‍ය සිසුන්ට ඉගැන්වීමට ප්‍රමාණවත් වෛද්‍යවරුන්, ශල්‍යාගාර, වාට්ටු සහ ඒවා පවත්වාගෙන යාමට අවශ්‍ය කාර්ය මණ්ඩලය හා උපකරණ තිබේද;

(iv) නොඑසේ නම්, එම මූලික අවශ්‍යතා සම්පූර්ණ කිරීමට ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2548/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2009 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා පොලීසිය වෙත ලැබී ඇති ස්ත්‍රී දූෂණ, ලිංගික අපයෝජන හා ළමා අපචාර සම්බන්ධ පැමිණිලි සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පැමිණිලි අතරින් මේ වනවිට පරීක්ෂණ අවසන් කර ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

2831/'12

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වැන්දඹු කාන්තාවන්ට ආර්ථික වශයෙන් ස්ථාවරභාවයක් ලඟාකරදීමට සහය වනු පිණිස, රජය විසින් කිසියම් ප්‍රතිපත්තීන් සමූහයක් ක්‍රියාත්මක කරමින් තිබෙන්නේද;

(ii) එසේ නම්, එලෙස ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්තීන් කවරේද;

(iii) එම කාන්තාවන්ට නැවත සමාජගතවීමට සහය වනු පිණිස අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරනු ලබන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමට අදහස් කරන සැලසුම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2849/'12

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) නුවරඑළිය විවිධසේවා සමූපකාර සමිතියට අයත් දෙමහල් ගොඩනැගිල්ලක් බදුදීමට 2011 දෙසැම්බර් 19 දින පුවත්පත් දැන්වීමක් මගින් ටෙන්ඩර් කැඳවූයේද;

(ii) එසේ නම්, ඉදිරිපත් කළ මිල ගණන් කවරේද;

(iii) පිළිගත් පටිපාටිය අනුව ටෙන්ඩර් කැඳවීමකදී සලකා බලන සහ ප්‍රමුඛතාවය ලබා දෙන කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත ගොඩනැගිල්ල,

(i) ලබා ගැනීමට රුපියල් 320,000/- ක් සහ රුපියල් 355,000/- ලෙස මිල ගණන් ඉදිරිපත්ව තිබූ බවත්;

(ii) ටෙන්ඩර් අයදුම්පතක් හෝ ඉදිරිපත් නොකළ පුද්ගලයකුට මේ වන විට ලබා දී ඇති බවත්;

(iii) බදු දීමේදී අක්‍රමිකතාවයක් සිදු වී ඇති බවත්;

(iv) අක්‍රමිකව ලබාදීම නිසා අයදුම්කරුවන්ට අසාධාරණයක් මෙන්ම අදාළ සමූපකාර සමිතියට අලාභයක් සිදුවී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඉහළම ටෙන්ඩරයට ගොඩනැගිල්ල ලබා නොදීමට හේතු කවරේද;

(ii) දැනට ගොඩනැගිල්ල ලබා දී ඇති අයගෙන් සමූපකාර සමිතිය ලබා ගන්නා මුදල කොපමණද;

(iii) ඉහත අක්‍රමිකතාව සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදුකොට ටෙන්ඩර්කරුවන්ට සාධාරණයක් ඉටු කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා කොපමණ කාලයක් ගතවේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2907/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2010 සිට 2011 දෙසැම්බර් මස 31 දක්වා එක් එක් අමාත්‍යාංශය යටතේ ඉදිරිපත් කර ඇති පරිපූරක ඇස්තමේන්තු සංඛ්‍යාව හා ඒවායේ මූල්‍යමය වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2010 සිට 2012 දෙසැම්බර් මස 31 දක්වා ජාතික අය-වැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ අයවැය සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මගින් සිදුකළ පරිපූරක වෙන්කිරීම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබේද;

(ii) එසේ නම්, එම පරිපූරක වෙන් කිරීම් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත කාල සීමාව තුළදී සිදුකළ එක් එක් පරිපූරක වෙන් කිරීමට අදාළව;

(i) ප්‍රතිපාදන සලසා දුන් දිනය කවරේද;

(ii) සලසා දුන් එක් එක් ප්‍රතිපාදනයේ වටිනාකම කොපමණද;

(iii) පරිපූරක ප්‍රතිපාදන ලබාගත් වැය ශීර්ෂ අංකය කවරේද;

(iv) අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව වියදම් ඒකකය කවරේද;

(v) ප්‍රතිපාදන ලබාදුන් හේතුව කවරේද;

යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් නොකර වැය ශීර්ෂ 240 යටතේ සිදුකෙරෙන පරිපූරක වෙන් කිරීම් මගින් ප්‍රතිපාදන ලබා ගැනීමට තුඩු දුන් හේතු කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

3172/'12

ගරු ඊ. සරවනපවන් මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මරුදන්කේනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායෙහි සේවය කරන ග්‍රාම නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) නැවත පදිංචි කිරීමේ කටයුතු සිදුකරන මෙම ප්‍රදේශවල පවතින ග්‍රාම නිලධාරී පුරප්පාඩු පිරවීම සඳහා කඩිනම් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ආ) (i) යාපනය පරිපාලන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15 ක පවතින ග්‍රාම නිලධාරී පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) යාපනය දිස්ත්‍රික්කයේ මේ වන විට ඇති ස්ථිර ග්‍රාම නිලධාරීන් නොමැති වැඩබලන ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3200/'12

ගරු පී. හැරිසන් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු මැද පළාත් සභාව මගින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉදිකර ඇති කිරිහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කිරිහල් ඉදිකර ඇති ස්ථාන කවරේද;

(iii) එම එක් කිරිහලක් සඳහා වැයකළ මුදල කොපමණද;

(iv) එම කිරිහල්වල ගවයින්ගේ ඡායාරූපවලට අමතරව වෙනත් අයගේ ඡායාරූප ප්‍රදර්ශනය කරනු ලබන්නේද;

(v) එසේ නම්, එම ඡායාරූප කාගේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් කිරිහල් මේ වනවිට ජනතාවගේ ප්‍රයෝජනය සඳහා විවෘතව ඇති සංඛ්‍යාව කොපමණද;

(ii) ප්‍රයෝජනයට නොගෙන වසා දමා ඇති කිරිහල් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම කිරිහල් පවත්වාගෙන යෑම සඳහා බඳවාගෙන ඇති සේවක සංඛ්‍යාව කොපමණද;

(iv) එම සේවකයින්ගේ පත්වීම් සිදුකර ඇත්තේ ස්ථිර, තාවකාලික හා සේවා අවශ්‍යතාවයන් අනුව යන පදනම් අතුරින් කවර පදනමක් යටතේද;

(v) මෙම කිරිහල් සඳහා කිරි සපයනු ලබන ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2143/'11

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල සඳහා මුදල් යෙදවීමට රජයට අරමුදල් ලබාදුන් පෞද්ගලික අංශයේ පුද්ගලයින්ගේ නම් කවරේද;

(ii) ඉහත කී ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට සහයෝගය ලබා ගැනීම සඳහා මෙරටට ගෙන්වා ගන්නා ලද පුද්ගලයින් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවට සහයෝගය ඉල්ලා සිටීම සඳහා විදේශගතවූ පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) ඒ වෙනුවෙන් දරන ලද මුළු පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2011 නොවැම්බර් මාසයේ සෙන්ට් කිට්ස් නගරයට ගිය පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ ගිය පුද්ගලයින්ගේ නම් කවරේද;

(iii) එහි යාමට සහ ආපසු ඒමට දැරූ මුළු වියදම කොපමණද;

(iv) එම කණ්ඩායම සඳහා ලබාගත් කුලී ගුවන් යානා සඳහා දැරූ වියදම කොපමණද;

(v) ජයග්‍රහණය පිළිබඳ එපමණ විශ්වාසය තබා තිබියදී ශ්‍රී ලංකාවට පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල සඳහා සත්කාරක රට ලෙස කටයුතු කිරීමේ අවස්ථාව අහිමි වූයේ කෙසේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2148/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික ලොතරැයි මණ්ඩලයට 2005 වර්ෂයේ සිට මේ දක්වා කාලසීමාව තුළ බඳවා ගෙන ඇති සේවක සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වන විට එහි පවතින සේවක අතිරික්තය හෝ සේවක ඌනතාවය කොපමණද;

(iv) අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයින් බඳවාගෙන තිබේ නම්, එයට හේතු කවරේද;

(v) අතිරික්ත සේවකයින් බඳවා ගැනීමට අනුමතිය ලබා දුන් බලධරයාගේ නම සහ තනතුර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2223/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, කොළඹ නගරයේ පැල්පත්වාසීන්ගේ නිවාස ගැටලුව විසඳීම සඳහා නිවාස ඒකක 40,000කින් සමන්විත මහල් නිවාස යෝජනා ක්‍රම 20ක් කොළඹ සහ තදාසන්න නගරවල ඉදිකිරීම පිණිස රුපියල් කෝටි 500ක ආරම්භක ප්‍රාග්ධනයක් ඉදිරි අයවැයෙන් වෙන්කරන බවට පොරොන්දුවක් දුන් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පොරොන්දුව පරිදි රුපියල් කෝටි 500 ක් අයවැයෙන් වෙන් කළ වර්ෂය කුමක්ද;

(ii) එම මුදලින් මේ වනවිට ඉදිකිරීම් ආරම්භකර ඇති මහල් නිවාස යෝජනා ක්‍රම සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වන විට ඉදිකිරීම් අවසන් කර ඇති මහල් නිවාස යෝජනා ක්‍රම සංඛ්‍යාව කොපමණද;

(iv) ඉදිකිරීම් අවසන් මහල් නිවාස යෝජනා ක්‍රමවල මේ වන විට පදිංචිකර ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2980/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිසිදු ප්‍රසිද්ධ දැන්වීමකින් හෝ අයදුම්පත්‍ර කැඳවීමකින් තොරව ආදේශක කම්කරුවන් 400 කට ආසන්න පිරිසක් දුම්රිය දෙපාර්තමේන්තුවට හදිසියේ බඳවා ගෙන ඇති බවත්;

(ii) දැනටමත් සැලකිය යුතු සේවක සංඛ්‍යාවක් සිටින දුම්රිය දෙපාර්තමේන්තුවට තවත් ආදේශක සේවකයින් බඳවා ගැනීම නිසා එම දෙපාර්තමේන්තුව තව තවත් පාඩු ලබන ආයතනයක් බවට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පරිදි අතිරේක සේවක පිරිසක් දුම්රිය දෙපාර්තමේන්තුවට බඳවා ගනු ලැබූ ක්‍රියාපටිපාටිය කවරේද;

(ii) එපමණ සේවක පිරිසක් අනුයුක්ත කරගනු ලැබුවේ කවර නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේද;

(iii) එම සේවකයින් බඳවා ගැනීමට සම්බන්ධ නිලධාරීන් පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ ඇයි?

---

## 2013 අප්‍රේල් මස 23 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2315/'12

ගරු රවී කරුණානායක මහතා,— කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1958 සේවක අර්ථසාධක අරමුදල පනත 2012 ජනවාරි මස 18 වැනි දින සංශෝධනය කළ බවත්;

(ii) සේවක අර්ථසාධක අරමුදලේ මුදල් ඉඩමක් මිලදීගැනීමට සහ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට යොදා ගැනීම සඳහා එම සංශෝධනය සිදු කළ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ගොඩනැගිල්ල සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය කොපමණද;

(ii) එම ගොඩනැගිල්ලේ වර්ග අඩියක් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

(iii) එම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ අයගේ නම් සහ ඔවුන් ඉදිරිපත් කරන ලද මිල ගණන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ගොඩනැගිල්ල මහල් තිස් පහකින් සමන්විත විය යුතු බවට යෝජනා කිරීමේ වගකීම් භාර ගත යුතු පුද්ගලයාගේ නම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සේවක අර්ථසාධක අරමුදලේ මුදල් ගොඩනැගිලි ඉදිකිරීම වැනි කාර්යයකට යොදවා නාස්තියක් සිදුකිරීමට හේතු කවරේද;

(ii) ඉහත සඳහන් කාර්යය සඳහා රාජ්‍ය මුදල් යොදා නොගැනීමට හේතුව කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2459/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෙන්පති හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා විසින් 1890 දී ආරම්භ කළ මහනුවර ශ්‍රී රාහුල විද්‍යාලයට අනුබද්ධව පේෂකර්ම පාසලක් පවත්වාගෙන ගොස් ඇති බවත්;

(ii) වර්ෂ 1962 දී ඉහත පාසල රජයට පවරා ගැනීමෙන් පසුව එහි පේෂකර්ම පාසලේ සේවයකළ ඊ. කැකුළාවල නමැත්තියට පාසලෙහි දේපලවලින් ඉවත්වන ලෙස මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අංක මපා/ර.ප.ව./293 දරන 1965.07.26 දිනැති ලිපියෙන් දන්වා තිබූ බවත්;

(iii) කැකුළාවල නමැත්තිය ඒ අනුව කටයුතු නොකළ අතර ඇයගෙන් පසුව එම්. ජේ. මෙන්ඩිස් නමැත්තෙකු එහි අනවසරයෙන් පදිංචිව සිටින බවත්;

(iv) ඔහුට එරෙහිව මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා විසින් පැවරූ අංක 75269 දරන නඩුවේ 1988.03.08 දිනැති තීන්දුව මගින් පාසල් භූමියෙන් ඉවත්වන ලෙස කර ඇති නියෝගය අනුව ඔහු මෙතෙක් කටයුතු කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පාසල් භූමිය තුළ අනවසර පදිංචිකරුවකු සිටීම පාසල් පරිපාලනයට විශාල බාධාවක් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, අධිකරණ තීන්දුව අනුව හෝ වෙනත් නීත්‍යානුකූල ක්‍රමවේදයන් මගින් ඔහු ඉවත් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2508/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන්නි දිස්ත්‍රික්කයේ, මහවැලි එල් (L) කලාපය යටතේ ක්‍රියාත්මකවන වැලිඔය ව්‍යාපාරයට අයත් වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව්වල නම් කවරේද;

(iii) එම එක් එක් වැවෙන් පෝෂණයවන කුඹුරු අක්කර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එක් එක් වැව යටතේ වගාකරනු ලබන කුඹුරු ඉඩම් පිහිටි ග්‍රාම නිලධාරී වසම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) අදාළ ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ප්‍රමාණවත් පරිදි ජලය නොලැබෙන නිසා මේ වන විට තම වගා කටයුතු එක් කන්නයකට පමණක් සීමා කිරීමට වැලිඔය ව්‍යාපාරය යටතේ වගා කටයුතු කරන ගොවින්ට සිදුවී ඇති බවත්;

(ii) එම හේතුවෙන් ඔවුන් මහත් දුෂ්කරතාවයන්ට මුහුණපා ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) වැලිඔය ව්‍යාපාරයේ වාරි ජලය හිඟතාව නිසා මතුව ඇති ගැටලු විසඳීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඒවා ක්‍රියාවට නැංවීම සඳහා කොපමණ කාලයක් ගතවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2539/'12

ගරු අනුර දිසානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගමේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් එක් සාමාජිකයා විසින් 2009 වර්ෂයේ සිට මේ දක්වා යෙදී ඇති විදෙස් සංචාර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් සංචාරය සිදුකළ රටවල්, ඒවායේ අරමුණු හා ඉන් ලැබුණු ප්‍රතිඵල එක් එක් සංචාරය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් එක් සංචාරය සඳහා ඒ ඒ පුද්ගලයා වෙනුවෙන් වැය කළ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2637/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුනාමි අවස්ථාවක තොරතුරු ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව අවට මුහුදේ පිහිටුවා ඇති සුනාමි තොරතුරු ලබා ගැනීමේ කුලුනු සංඛ්‍යාව සහ ඒවා සවි කිරීම සඳහා වැය වූ මුදල කොපමණද;

(ii) ඒවා ස්ථානගත කරන ලද දිනය, ඒවා මගින් දත්ත ලබා ගන්නා ආයතනය සහ එම කුලුනු හරහා පැමිණෙන සුනාමි පිළිබඳව අදාළ ආයතනය දැනුවත් වීමෙන් පසු ශ්‍රී ලංකාවට එම සුනාමිය මගින් බලපෑමක් ඇතිවීමට ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2012.04.11 දින හෝ ඊට ආසන්න දිනක සුමාත්‍රාවල ඇති වූ සුනාමි තත්ත්වය ශ්‍රී ලංකාවට බලපාන බවට තොරතුරු අපගේ සුනාමි කුලුනු හරහා ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, එම සුනාමි තත්ත්වය පිළිබඳ මහජනයා දැනුවත් කිරීම සඳහා අදාළ තොරතුරු ලබාගත් ආකාරය කවරේද;

(iii) ඉහත (ආ)(ii) අනුව තොරතුරු වෙනත් ආකාරයකින් ලබා ගත්තේ නම්, සුනාමි තොරතුරු ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව සුනාමි කුලුනු පිහිටුවීමේ අරමුණ කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2830/'12

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රෝහල් සඳහා ශල්‍ය අත්වැසුම් සැපයුම්කරුවන් තෝරාගැනීම සඳහා යොදාගන්නා ක්‍රියාවලිය කවරේද;

(ii) ශල්‍ය අත්වැසුම් මිලදී ගැනීම සම්බන්ධයෙන් තීරණ ගන්නා පුද්ගලයන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) සැපයුම් දිනය, සැපයුම් කාල සීමාව සහ එකඟ වී ඇති කාල පරිච්ඡේදය තුළ සැපයුම් කිරීමට නොහැකි වීම සම්බන්ධයෙන් සැපයුම් කොන්ත්‍රාත්තුවෙහි දක්වා ඇති සම්මත වගන්ති කවරේද;

(iv) 2008, 2009, 2010 හා 2011 යන වර්ෂවලදී ශල්‍ය අත්වැසුම් මිලදී ගැනීම සඳහා වෙන්කර තිබූ මුදල සහ වියදම්කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මූලික පරීක්ෂණයකදී ශල්‍ය අත්වැසුම් මිලදී ගැනීම සම්බන්ධයෙන් වූ වංචාවක් හෙළිදරව් වී ඇති බවත්;

(ii) වැඩිදුර පරීක්ෂණ සඳහා මෙම වංචාව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත යොමුකර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එකී වංචාවේ ස්වභාවය කවරේද;

(ii) එකී වංචාව හේතුවෙන් සිදුවී ඇති මූල්‍යමය පාඩුව කොපමණද;

(iii) ඉහත (ආ) (ii) හි සඳහන් පරිදි එය සිදු කළේ නම්, එම පරීක්ෂණයේ ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2981/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බුලත්සිංහල රෝහලේ ප්‍රමාණවත් තරම් හෙද හෙදියන්, සෞඛ්‍ය කළමනාකරණ සහකරුවන්, වෛද්‍ය රසායන ශිල්පීන්, විශේෂඥ වෛද්‍යවරුන් සනීපාරක්ෂක කම්කරුවන්, ලිපිකරුවන් සහ ගිලන් රථ නොමැති බවත්;

(ii) එම අඩුපාඩු නිසා රෝගීන් දැඩි අසරණ තත්ත්වයකට පත්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) බුලත්සිංහල රෝහල වෙත ප්‍රතිකාර සඳහා දිනකට පැමිණෙන රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එහි පවතින අඩුපාඩු පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) බුලත්සිංහල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය උසස් කිරීම උදෙසා එම රෝහලෙහි පවතින සියලු අඩුපාඩු සකස් කරදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3136/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 අප්‍රේල් 30 සිට මැයි 30 දක්වා වූ කාලය "රණවිරු මාසය" ලෙස සමරනු ලැබුවේද;

(ii) එකී රණවිරු මාසයට අදාළව "රණවිරු කොඩි" නිර්මාණය කරනු ලැබුවේද;

(iii) එසේ නම්, එම රණවිරු කොඩි නිර්මාණය සඳහා ගිය වියදම කොපමණද;

(iv) රණවිරු කොඩි අලෙවියෙන් ලැබුණු ආදායම කොපමණද;

(v) රණවිරු අරමුදල් කැට නිෂ්පාදනය සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3196/'12

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී සෞදි අරාබියේ ගෘහ සේවිකාවන් වශයෙන් සහ වෙනත් රැකියා සඳහා ගොස් ඇති ශ්‍රී ලාංකික කාන්තාවන් සහ පිරිමින් විශාල සංඛ්‍යාවක් ඉතා දුක් විඳිමින් දැනට එම රටේ "ඔලායා" රුඳවුම් කඳවුරේ සහ "ජෙඩා පාලම යට" රැඳී සිටින බවත්;

(ii) අදාළ ගිවිසුම් පරිදි සුදුසු රැකියා ස්ථාන නොලැබීම, හිංසනය සහ වැටුප් නොගෙවීම වැනි විවිධ කරුණු ඒ සඳහා හේතු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ශ්‍රී ලාංකික පිරිස වහාම මෙරටට ගෙන්වා ගැනීමට කටයුතු කරන්නේද;

(ii) ඔවුන්ගේ පවුල්වල ආරක්ෂාව, සුභසාධනය සහ ආර්ථිකය නංවාලීම සඳහා ක්ෂණිකව ක්‍රියාත්මක කළ හැකි, ප්‍රායෝගික වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3201/'12

ගරු පී. හැරිසන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතුව ඇති බීජ ගොවිපළවල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා අතරින් වී පිළිබඳව, වෙනත් ධාන්‍ය පිළිබඳව හා වෙනත් කටයුතු සම්බන්ධයෙන් පර්යේෂණ සිදුකරනු ලබන ගොවිපළවල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් ගොවිපළ සතු ඉඩම් හෙක්ටයාර් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය විසින් වර්ෂ 2005 සිට 2012 දක්වා සිදුකළ පර්යේෂණ කටයුතු තුළින් අලුතින් සොයාගන්නා ලද භෝග වර්ග කවරේද;

(ii) එම නව භෝග වර්ග අතරින් ගොවීන්ට හඳුන්වා දී ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) මේ දක්වා බතලගොඩ හා අනෙකුත් කෘෂි පර්යේෂණ ආයතන මගින් හඳුන්වා දී ඇති නව වී වර්ග එක් එක් ආයතනය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ශ්‍රී ලංකාවේ සොයාගෙන ඇති බාස්මතී වී වර්ග සංඛ්‍යාව කොපමණද;

(v) එම බාස්මතී වී වර්ගවල නම් සහ සොයා ගැනීම සිදුකළ ආයතන කවරේද;

(vi) දැනට සොයාගෙන ඇති නව වී, ධාන්‍ය, පළතුරු හා එළවළු වර්ගවල බීජ මිලදී ගත හැකි ස්ථාන තිබේද;

(vii) එම ස්ථාන කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3208/'12

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1994 වර්ෂයේදී ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය මගින් ආරම්භ කරන ලද මරදාන ට්‍රිපොලි වෙළඳ සංකීර්ණය නමින් ස්ථානයක් පවතින බවත්;

(ii) දිවයින පුරා විසිරී සිටි මිලදී ගැනීමේ මධ්‍යස්ථාන පවත්වාගෙන ගිය 350 ක් පමණ වෙළඳ පිරිසකගෙන් තෝරාගන්නා ලද නියෝජිතයන් 21 දෙනකුගේ පෞද්ගලික මුදලින් ට්‍රිපොලි වෙළඳ සංකීර්ණයේ ගොඩනැගිල්ල ඉදිකර ඇති බවත්;

(iii) දැනට එම වෙළඳ මධ්‍යස්ථානය අවට සිදුකරනු ලබන හමුදා ක්‍රියාකාරකම් නිසා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට නොහැකිව එම ව්‍යාපාරිකයන් අසරණ තත්ත්වයට පත්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වෙළඳ මධ්‍යස්ථානයේ වත්මන් භාරකරුවෝ කවුරුන්ද;

(ii) අධි ආරක්ෂිත කලාප පවා විවෘත කර ඇති සමයක එම වෙළඳ මධ්‍යස්ථානයට ඇතුළුවන මාර්ග වසා තැබීමට හේතු කවරේද;

(iii) එහි හිමිකරුවන්ට ව්‍යාපාර කටයුතු කරගෙන යාමට එම මධ්‍යස්ථානය ලබා දෙන්නේද;

(iv) නොඑසේ නම්, වෙනත් විකල්පයන් ලබා දෙන්නේද;

(v) විකල්පයක් ලබා දෙන්නේ නම්, එය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2318/'12

ගරු රවී කරුණානායක මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2011 වර්ෂයට අදාළව,

(i) නිවාස ඉදිකිරීම වෙනුවෙන් ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය විසින් වැය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාස ඉදිකරනු ලැබ ඇති ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2012 වර්ෂයට අදාළව,

(i) නිවාස සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) මේ වන විට ඒ සඳහා වැය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) අලුතින් ඉදිකරන ලද නිවාස පිහිටා ඇති ස්ථාන කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2509/’12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පෙර පාසල් පවත්වාගෙන යනු ලබන ගම්මාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පෙර පාසල්වල භෞතික සම්පත් ඌනතා රැසක් පවතින බව පිළිගන්නේද;

(ii) එම ඌනතාවයන් මඟහැරවීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(iii) මෙම ඌනතා සම්පූර්ණ කිරීමට ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2638/’12

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයෙන් ඉටුවන කාර්යභාරය කවරේද;

(ii) එහි සේවය කරන සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) එය පිහිටා ඇති ස්ථානය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් කාර්යාංශය සඳහා පරිගණක මෘදුකාංග කට්ටලයක් මිල දී ගෙන හෝ මිල දී ගැනීමට කටයුතු සූදානම් කර තිබේද;

(ii) ඒ සඳහා වැයවූ හෝ වැයවන මුදල කොපමණද;

(iii) එම මෘදුකාංග කට්ටලය මිලදී ගත් හෝ මිල දී ගැනීමට අපේක්ෂිත රට කවරේද;

(iv) රජයේ පිළිගත් ක්‍රමවේදයන්ට අනුව එකී මිල දී ගැනීම සිදුකර හෝ සිදුකිරීමට කටයුතු කර තිබේද;

(v) එකී මෘදුකාංග කට්ටලය මිල දී ගැනීමේ අරමුණ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2982/’12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගුරුවරුන්ගේ වෘත්තීය ගෞරවය රැකෙන පරිදි ජීවන වියදමට සරිලන ස්ථාවර වැටුප් ක්‍රමයක් සකස් කර නොමැති බවත්;

(ii) අධ්‍යාපන අමාත්‍යාංශය එකඟ වී ඇති පරිදි අතුරු වැටුප් යෝජනාව හිඟ වැටුප් සහිතව ලබාදීමට තවමත් නිසි ක්‍රමවේදයක් සකස් කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් අතුරු වැටුප් යෝජනාව හිඟ වැටුප් සහිතව ලබා දීමට මෙතෙක් නොහැකි වීමට හේතු කවරේද;

(ii) එම අතුරු වැටුප් යෝජනාවට අනුව ගුරුවරුන්ට හිමි විය යුතු මුළු හිඟ වැටුප් ප්‍රමාණය කොපමණද;

(iii) වැටුප් ගැටලුවට අමතරව ගුරු-විදුහල්පති එකමුතුව විසින් කළ අනෙකුත් ඉල්ලීම් ඉටු කර දීමට කටයුතු කරන්නේද;

(iv) ගුරුවරුන් හා විදුහල්පතිවරුන් වෙනුවෙන් ස්ථාවර වැටුප් ක්‍රමයක් සකස් කර ඔවුන්ගේ වැටුප් ගෙවීමට කොපමණ කාලයක් ගතවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 අප්‍රේල් මස 24 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1601/'11

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2004.01.01 දින සිට අද දක්වා වූ කාලය තුළ අධිචෝදනා ගොනුකිරීමෙන් පසුව නීතිපතිවරයා විසින් ඉල්ලා අස්කරගෙන ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එලෙස අධිචෝදනා ඉදිරිපත් කරන ලද නඩුවල සහ පුද්ගලයන්ගේ නම් සහ එම අධිචෝදනාපත්‍ර භාරදුන් දිනයන් කවරේද;

(iii) එලෙස අධිචෝදනාපත්‍ර භාරදීමෙන් අනතුරුව ඒවා ඉල්ලා අස්කර ගැනීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) භාරදුන් අධිචෝදනාපත්‍රයක් ඉල්ලා අස්කර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් දරන ලද වියදම කොපමණද;

(ii) ඒ සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන්ගේ නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1829/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය අධ්‍යාපන කාර්යාලයට අයත්, මොරවක, කොටපොල හා පස්ගොඩ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවලින් පාලනය වන රජයේ පාසල්වල දුෂ්කර සේවා කාලය අවසන්වීමෙන් පසු ස්ථාන මාරුවීම් නොලැබීම නිසා දැඩි කලකිරීමට පත් විශාල ගුරු පිරිසක් සිටින බවත්;

(ii) මෙම හේතුව නිසා එම ගුරුවරුන්ගේ ඉගැන්වීමේ කටයුතුවල ගුණාත්මකභාවය පිරිහීමට ලක් විය හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ගුරු මාරු මණ්ඩල තීරණයන්ට අනුව ස්ථාන මාරු සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් කවරේද;

(ii) මේ වනවිට ඉහත අධ්‍යාපන කලාප තුළ දුෂ්කර සේවා කාලය අවසන්වීමෙන් පසු ස්ථාන මාරුවීම් ඉල්ලා ඇති ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ට ස්ථාන මාරුවීම් ලබා දීම සඳහා වැඩ පිළිවෙළක් සකසා තිබේද;

(iv) එම ක්‍රමවේදය කවරේද;

(v) ඒ අනුව ස්ථාන මාරු ලබා දෙන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2511/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පිරිසිදු පානීය නල ජල සැපයුමක් ඇති ගම්මාන කවරේද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පිරිසිදු පානීය නල ජල සැපයුම නොමැති ගම්මාන කවරේද;

(iii) එම ගම්මානවලට පිරිසිදු පානීය ජලය ලබාදීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර කාල වකවානුවක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2698/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඩෙංගු මර්දනය සඳහා කියුබාවෙන් BTI බැක්ටීරියාව ගෙන්වන ලද දිනය කවරේද;

(ii) එම බැක්ටීරියාව ගෙන්වන ලද ප්‍රමාණය කොපමණද;

(iii) ඒ සඳහා වැයවූ සමස්ත මුදල කොපමණද;

(iv) එම මුදල වියදම් කළ ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) BTI බැක්ටීරියාව ශ්‍රී ලංකාවේ ඩෙංගු මර්දනයට සුදුසු බවට නිර්දේශ කළේ කවුරුන්ද;

(ii) මෙරට ඩෙංගු මර්දන ක්‍රියාවලිය සඳහා එම බැක්ටීරියාව භාවිතාකර ඇති ප්‍රමාණය කොපමණ ද;

(iii) අද වනවිට එකී බැක්ටීරියාව ගෙන්වා භාවිතා කිරීම තුළින් ඩෙංගු මර්දනයේදී අත්කර ගෙන ඇති ප්‍රගතිය කුමක්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2870/'12

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දෘෂ්‍ය හා ප්‍රසාංගික කලා විශ්වවිද්‍යාලය මගින් ප්‍රවේශ අවශ්‍යතාවයක් ලෙස ක්‍රියාත්මක කරන ලද අභියෝගතා පරීක්ෂණය නතර කිරීමට හේතු කවරේද;

(ii) ඉහත කී අභියෝගතා පරීක්ෂණය නතර කිරීම සඳහා වූ තීරණය ගැනීමට පෙර විශ්වවිද්‍යාල නිලධාරීන් සමග සාකච්ඡා කිසිවක් පවත්වන ලද්දේද;

(iii) නොඑසේ නම්, එවැනි සාකච්ඡාවක් නොපැවැත්වීමට හේතු කවරේද;

(iv) එසේ නම්, ප්‍රවේශ අවශ්‍යතාවයක් ලෙස අභියෝගතා පරීක්ෂණය පැවැත්වීම නතර කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල නිලධාරීන් දරන ලද ස්ථාවරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තම හිතවත් අයැදුම්කරුවන්ට කථිකාචාර්යවරුන් පක්ෂපාතී වන්නේය යන පදනම මත අභියෝගතා පරීක්ෂණය දූෂිත බවට අයදුම්කරුවන්ගෙන් අමාත්‍යාංශය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත පෙත්සම් ලැබී තිබේද;

(ii) එසේ නම්. මේ සම්බන්ධයෙන් කිසිදු විමර්ශනයක් හෝ පරීක්ෂණයක් නොපැවැත්වීමට හේතුව කවරේද;

(iii) ඉහත කී අභියෝගතා පරීක්ෂණයේ විනිවිදභාවය වැඩි දියුණු කිරීමට අමාත්‍යාංශය උත්සාහ දරා තිබුනේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2984/’12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යුද්ධය නිසා අවතැන් වූ උතුරු පළාතේ මුස්ලිම් ජනතාව යළි පදිංචියේදී අවශ්‍ය ලියාපදිංචි කිරීම් සහ යටිතල පහසුකම් ලබා දෙන බවට වූ පොරොන්දුව මත තම මුල් ගම්බිම් වෙත නැවත සංක්‍රමණය වී ඇති බවත්;

(ii) එවැනි පවුල් 32,000 කට පමණ අවශ්‍ය ලියාපදිංචි කිරීම්, යටිතල පහසුකම් හා අධ්‍යාපන පහසුකම් ආදිය ලබාදීමට තවමත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත්;

(iii) මේ වනවිට මෙම ගැටලුව පිළිබඳව සාකච්ඡා වට 1400 කදී පමණ කරුණු දක්වා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2012 වර්ෂය තුළ නැවත මුල් ගම් බිම් කරා සංක්‍රමණය වී ඇති අවතැන් වූ මුස්ලිම්වරුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) සංක්‍රමණය වූ එම ජනතාවගෙන් මේ වන විට ලියාපදිංචිකර ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) අවතැන්වූ මුස්ලිම්වරුන් නැවත පදිංචි කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන් රාජ්‍ය නොවන සංවිධාන විසින් ලබාදී තිබියදීත්, අවශ්‍ය ලියාපදිංචි කිරීම් කටයුතු සහ යටිතල පහසුකම් ලබාදීමේ කටයුතු සිදු නොකිරීමට හේතු කවරේද;

(iv) වෙනත් රටක් මැදිහත් වී මෙම ප්‍රශ්නය විසඳීමට පෙර අදාළ පහසුකම් සහ ලියාපදිංචිය ඔවුන්ට ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3137/’12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2005 වර්ෂයේ සිට 2012.06.01 දින දක්වා කාලය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් ලබාදෙන සමාවක් මත නිදහස් වූ මරණීය දඬුවම ලබා සිටි,

(i) සිරකරුවන්ගේ නම් කවරේද;

(ii) එම එක් එක් සිරකරුවා "මරණීය දඬුවමට යටත් කළ සිරකරුවෙකු" ලෙස බන්ධනාගාරය තුළ ගත කර ඇති කාලය කොපමණද;

(iii) එම එක් එක් සිරකරුවා නිදහස් කළ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 ව්‍යවස්ථාව ප්‍රකාරව වත්මන් ජනාධිපතිවරයා විසින් දෙන ලද සමාව යටතේ නිදහස් කරන ලද තැනැත්තන් අතර සිටි,

(i) පුද්ගල ඝාතනයට වරදකරුවන් වූ අය කවුරුන්ද;

(ii) හෙරොයින් ජාවාරම හෝ ළඟ තබා ගැනීමට වරදකරුවන් වූ අය කවුරුන්ද;

(iii) ඉහත වර්ග දෙකට අයත් නොවන අය සිටී නම්, එම සිරකරුවන්ගේ නම් සහ අදාළ වැරදි කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3173/'12

ගරු අනෝමා ගමගේ මහත්මිය,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2009 සිට මේ දක්වා ශ්‍රී ලංකාව තුළ සිදු වී ඇති කාන්තා අපචාර හා ළමා අපචාර සංඛ්‍යාව වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් අපරාධ පාලනය කළ නොහැකි තරමට සීඝ්‍රයෙන් වර්ධනය වී ඇති බවත්;

(ii) අදාළ අපරාධකරුවන් නීතියේ රැහැනට හසුකර ගැනීමේදී ශ්‍රී ලංකා පොලීසිය මන්දගාමී ස්වභාවයක් පෙන්නුම් කරන බවත්;

(iii) උක්ත ළමා හා කාන්තා අපචාර වැඩි සංඛ්‍යාවකට චූදිතයින් වන්නේ රජයට සම්බන්ධ දේශපාලඥයින් බවත්;

(iv) එම හේතුව නිසා ඔවුන්ට එරෙහිව පියවර ගැනීම ප්‍රමාණවත්ව සිදු නොවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) අදාළ අමාත්‍යාංශය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සහ ළමා ආරක්ෂණ අධිකාරිය විසින් කාන්තා හා ළමා අපචාර වැළැක්වීම සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(ii) ඉහත ආකාරයේ අපරාධ වැළැක්වීම සඳහා UNICEF වැනි ජාත්‍යන්තර ආයතන සහ මෙරට ක්‍රියාත්මක වන වෙනත් රාජ්‍ය නොවන ආයතනවල සහභාගීත්වය ලබා ගැනීමට ක්‍රියා කරන්නේද;

(iii) එසේ නම්, ඊට අදාළව සිදුකරන කාර්යයන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3202/'12

ගරු පී. හැරිසන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට බීජ වර්ග ආනයනය කිරීමේදී බී ලූණු, වට්ටක්කා, මාළුමිරිස්, පතෝල, මිරිස්, තක්කාලි, වැටකොළු, පිපිඤ්ඤා, කැකිරි, මෑ, ගස්ලබු, මුංඇට, කරවිල හා රටකජු යන භෝග වර්ගවලින් වාර්ෂිකව ගෙන්වන බීජ ප්‍රමාණයන්;

(ii) ආනයනික එම එක් එක් බීජ වර්ග අතරින් පෞද්ගලික අංශය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ගෙන්වනු ලබන ප්‍රමාණයන්;

(iii) ඉහත සඳහන් එක් එක් බීජ වර්ගයේ කිලෝ එකක මිල;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දේශීයව නිෂ්පාදනය කරනු ලබන ඉහත එක් එක් භෝගයේ බීජ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රමාණයන් දේශීය බීජ අවශ්‍යතාව සපුරාලීම සඳහා ප්‍රමාණවත්වේද;

(iii) ඉහත සඳහන් බීජ දේශීය ගොවිපළවල නිෂ්පාදනය කරන්නේ නම්, ගොවීන්ට ඒවා ලබා දිය හැකි මිල ගණන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2322/'12

ගරු රවී කරුණානායක මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010, 2011 සහ 2012 වර්ෂයන්හි පළාත් සභා 9 සඳහා වෙන්කොට තිබූ සමස්ත අරමුදල් ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත කී වර්ෂයන් තුළ අරමුදල් ලබා දී ඇති, එක් එක් පළාත් සභාවට අයත් අමාත්‍යාංශයන් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2010, 2011 සහ 2012 වර්ෂයන්හිදී,

(i) එක් එක් පළාත් සභාව විසින්, රජයේ ප්‍රතිපාදනවලින් වියදම් කොට තිබූ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) පළාත් සභාව විසින්ම උපයාගත් මුදලින් කළ වියදම්වල වටිනාකම කොපමණද;

(iii) රජයේ ප්‍රදානයන් සහ ආදායම් බෙදාගැනීම් ලෙස එක් එක් පළාත් සභාව විසින් ලබා ගන්නා ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එක් එක් පළාත් සභාවන්හි අයවැය අවශ්‍යතාවන්හි හිඟය පියවා ගන්නා ආකාරය කවරේද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) ඉහත කී පළාත් සභාවන්ට මධ්‍යම ආණ්ඩුව සතු බලතල ලබා දීමෙන් අනතුරුව, පළාත් සභාවන්හි ආදායම් එකතු කිරීමේ ක්‍රමවේදය වැඩිදියුණු වී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2445/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් නිල්වලා ගඟේ බණ්ඩත්තර ප්‍රදේශයේ දී ලවණ බාධක වේල්ලක් ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කර තිබේද;

(ii) එම වේල්ල ඉදිකිරීමෙන් අත්කර ගැනීමට අපේක්ෂිත අරමුණු කවරේද;

(iii) එවැනි වේල්ලක් ඉදිකරන්නේ නම්, ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iv) එම ප්‍රතිපාදන දේශීය මූලාශ්‍රවලින් සපයාගන්නේද; නොඑසේ නම්, විදේශීය මූලාශ්‍රවලින් සපයා ගන්නේද;

(v) ඉහත සඳහන් වේල්ල ඉදිකිරීම සඳහා මුදල් සපයනු ලබන ආයතනය හෝ ආයතන සහ එක් එක් ආයතනය ලබා දෙන මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) බණ්ඩත්තර ප්‍රදේශයේ ලවණ බාධක වේල්ලක් ඉදිකිරීම නිසා විශාල ගොවි බිම් ප්‍රමාණයක වගා හානිවන බවට ප්‍රදේශයේ ගොවීන් චෝදනා කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2512/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ මාර්ග සංවර්ධන වැඩසටහන් සඳහා 2010, 2011, 2012 යන වර්ෂවලදී වැය කරන ලද මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මේ වන විට එම ප්‍රදේශය තුළ තිබෙන ග්‍රාමීය මාර්ග පද්ධතිය සම්පූර්ණයෙන්ම අබලන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම මාර්ග පිළිසකර කිරීමට අවශ්‍ය මුළු මුදල ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) අබලන් වී ඇති ඉහත මාර්ග පිළිසකර කිරීමට ගතවන කාලය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2699/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 සිට 2012 දක්වා කාල සීමාව තුළ වාර්ෂිකව ආනයනය කරන ලද පාම් තෙල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාල සීමාව තුළ පාම් තෙල් කිලෝග්‍රෑමයක් සඳහා ආනයන බදු වෙනස් කිරීම් සිදුකළ ආකාරය කවරේද;

(iii) ආනයන බදු එසේ වෙනස් කිරීමට හේතු කවරේද;

(iv) මේ වන විට දේශීය වෙළඳපොලේ පාම් තෙල් හා පොල්තෙල් කිලෝවක සිල්ලර මිල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පාම් තෙල් ආනයනයේදී ලිහිල් බදු ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ පොල්තෙල් නිෂ්පාදනය පහත වැටී ඇති බවත්;

(ii) පොල්තෙල් නිෂ්පාදනය පහත වැටීම හේතුවෙන් පොල් වගාකරුවන්ට සිය නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් නොලැබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2985/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පිටකොටුව - කොටුව ආශ්‍රිතව පදික වෙළඳාමේ යෙදුනු ස්වයං රැකියා වෙළෙඳුන් 1500කට පමණ තවමත් විකල්ප ව්‍යාපාර ස්ථාන ලැබී නොමැති බවත්;

(ii) 'දිවි නැගුම' ව්‍යාපෘතිය යටතේ ස්වයං රැකියා වෙළෙඳුන් සඳහා ක්‍රියාත්මක කළ 'ඩිමෝ බට්ටා' නම් වූ ව්‍යාපෘතිය යටතේ ජංගම රථ යොදා ගනිමින් වෙළඳාම් කිරීමේදී රථ වාහන පොලිසියේ සහ පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ බලපෑම් නිසා විවිධ අවස්ථාවලදී එම වෙළෙඳුන් දැඩි අසීරුතාවලට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට විකල්ප ස්ථාන ලබාදී ඇති පදික වෙළෙඳුන් සංඛ්‍යාව කොපමණද;

(ii) 'දිවි නැගුම' යටතේ 'ඩිමෝ බට්ටා' නම් වූ වාහන ලබාදී ඇති වෙළෙඳුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ට තම වෙළඳාම් කටයුතු කිසිදු බාධාවකින් තොරව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3203/'12

ගරු පී. හැරිසන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට පළිබෝධනාශක ආනයනය සඳහා බලපත්‍ර ලබා දී ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය විසින් වර්ෂ 2005 - 2012 දක්වා කාල සීමාව තුළදී ආනයනය කරන ලද පළිබෝධනාශක (කෘමිනාශක, වල්නාශක, දිලීරනාශක) ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත සඳහන් ආයතනවලින් මේ වන විට තහනම් කර ඇති සංඛ්‍යාව; කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ආනයනයට පෙර පළිබෝධනාශකවල තත්ත්වය පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, එය කවරේද;

(iii) ආනයනික කෘෂිරසායනික ද්‍රව්‍ය අතර ආසනික් හා මිනිසුන්ට හා සතුන්ට අහිතකර වෙනත් සංඝටක සහිත පළිබෝධනාශක තිබේද;

(iv) එසේ නම්, එම අහිතකර සංඝටක අඩංගු බව පරීක්ෂා කරනු ලබන ආයතන කවරේද;

(v) එම පරීක්ෂණ සඳහා රජයේ වෛද්‍ය විද්‍යාලයෙන් හෝ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පර්යේෂණාගාරවල සහාය ලබා ගන්නේද;

(vi) එසේ නම්, එම ආයතන කවරේද;

(vii) ඉහත ආයතනවලින් තත්ත්ව සහතික ලබාගත් පසු වගාවන් සඳහා එම පළිබෝධනාශක නිර්දේශ කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,

(i) කෘෂි රසායනික ද්‍රව්‍ය සම්බන්ධයෙන් මැදිහත්වන ආකාරය කවරේද;

(ii) ඒවායේ භාවිතය සම්බන්ධයෙන් ගොවීන් දැනුවත් කිරීමට ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?